// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2459/41 – 2025 ඔක්තෝබර් මස 23 වැනි බ්‍රහස්පතින්දා – 2025.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2025 අම්මඩුව කුඩා කතරගම දේවාලයේ ඇසළ පෙරහැර

**2025 වසරේ අම්මඩුව කුඩා කතරගම දේවාලයේ ඇසළ පෙරහැර මංගල්‍යය ඔක්තෝබර් මස 18 වන දින සුබ මොහොතින් ආරම්භ කෙරේ.**

- ඔක්තෝබර් මස 18 වන දින පිරිත් පිංකම සහ දානමය පිංකම
- ඔක්තෝබර් මස 18 වන දින සුබ මොහොතින් කප් සිටුවීම
- ඔක්තෝබර් මස 22 වන දින සිට ඔක්තෝබර් මස 26 දින දක්වා කුඹල් පෙරහැර
- ඔක්තෝබර් මස 27 වන දින සිට ඔක්තෝබර් මස 31 දින දක්වා දෙවේලේ පෙරහැර
- නොවැම්බර් මස 01 වන දින සිට නොවැම්බර් මස 05 දින දක්වා රන්දෝලි මහ පෙරහැර
- නොවැම්බර් මස 06 වන දින උදෑසන ඓතිහාසික දිය බෝල පොකුණේදී දිය කැපීමෙන් ඇසළ පෙරහැර නිමාවට පත් වේ.

II. දේවාලයේ උතුරට දේවාලයේ පිටුපස මූකලානද, දකුණට රංවල අම්මඩුව පාර ද, නැගෙනහිරට දේවගිරි කපු මහතාගේ ඉඩම ද, බස්නාහිරින් නිලමේ මහතාගේ ඉඩම ද සීමා වේ.

III. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලිහලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සලක් තත්කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිවලට හෝ කැවිලි සාදන ස්ථානයට, භෝජනාගාරයට හෝ දන්සලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් ආහාර පාන බෙදා හැරීමේ දී, විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී සහභාගිවීමට බලය නැත.

IV. දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයෙක් හෝ වෙනත් යම් සතෙකු කඳවුරු පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතුය.

1A – G 045656 – 04 (2025/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

V. කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසෙන් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනාගමනය හෝ පයින් ගමන් කිරීම තහනම්, එසේ වුවද 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සහ වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා කරත්ත ගෙනයාම, ගොනුන් දක්කා ගෙන යාම සම්බන්ධයෙන් මෙම නියෝග අදාළ නොවන්නේය.

VI. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි හා කැවිලි හල්, කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සල් යන වෙළඳ ව්‍යාපාරික කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1%ට (ඝන අඩි 4%) නොඅඩු ධාරිතාවක් ඇති දැවමය හෝ ලෝහමය කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර එකී කසළ බඳුන ඉවත් කරනු ලබන විට හෝ හැර සෑම අවස්ථාවක දීම දැවමය හෝ ලෝහමය පියනකින් වසා තැබිය යුතුය.

VII. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය යෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි කොටස් හෝ පිසීමේ දී ඉවතලන ද්‍රව්‍ය හෝ වෙනත් ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක බිමට විසිකරනු නොලැබිය යුතුය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතිරි කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වන නියෝගයේ විධිවිධාන සළසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතුය. එසේම ඉවතලන අපද්‍රව්‍ය කඳවුරු පෙදෙස ඇතුළත යම් සථානයක බිමෙහි හෝ ඒ අසල පොළොවෙහි විසි කොට තිබෙන බවට පෙනී ගියහොත් ඒ ස්ථානයේ අයිතිකරු, ප්‍රධාන මුරකරු හෝ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලු පූර්වෝපායන් නොයෙදූ බව සහ නොසැළකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් එහි අයිතිකරුගේ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලධාරියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සළකනු ලැබේ.

VIII. දිස්ත්‍රික් ලේකම්වරයාගේ මතය අනුව මෙම නියෝගවල 15 වැනි, 16 වැනි, 17 වැනි, 18 වැනි හෝ 19 වැනි නියෝගය කඩකරමින් පිහිටුවනු ලැබ ඇත්තා වූ, පවත්වාගෙන යනු ලබන්නා වූ ද, කඳවුරු පෙදෙස තුළ පිහිටියා වූ ද යම් බේකරියක්, කැවිල්ලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීම හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම් එකී බලපත්‍ර වහාම අවලංගු කිරීමට බලය ඇත.

IX. කඳවුරු පෙදෙස තුළ යම් ආසාදනයකින් පෙළෙන පුද්ගලයන් සිටිනවා නම් අන් පුද්ගලයන් ඇසුරු නොකළ යුතුය. එසේ සිටින බව අනාවරණය වුවහොත් වහාම පොලිස් නිලධාරියෙකුට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට දැන්විය යුතුය.

X. යම් ආසාදනයකින් පෙළෙන පුද්ගලයෙක් වෙතොත් එම පුද්ගලයාට ආහාර අලෙවිසැල්වලට ඇතුළු වීමට හෝ ආහාර සැල්වල ආහාර පිසීමට හෝ විකිණීමට ඉඩ නොදිය යුතුය.

XI. පෙරහැර භූමිය තුළ ඇති ආහාර අලෙවිසැල්වල යම් ආසාධිත පුද්ගලයන්ට නවාතැන් නොදිය යුතුය. එසේ සිටින බව දැනගත් විගස පොලිසියට හෝ මහජන සෞඛ්‍ය නිලධාරියාට ඒ බව දැන්විය යුතුය.

XII. 7 වැනි නියෝගය යටතේ සිහමන් යැදීම සහ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලක් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතුය.

XIII. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

XIV. දිස්ත්‍රික් ලේකම්, වෛද්‍ය නිලධාරියා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ යම් පොලිස් නිලධාරියෙකු විසින් (අ) මේ නියෝගය අතුරින් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ (ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් නාම ප්‍රදර්ශනය කර තැබීමෙන් කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේය.

**අනුරාධ ජයකොඩි,**
ප්‍රාදේශීය ලේකම්,
වැලිගෙපොල.

EOG 10 – 0230

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.